විවැ/පා 02/අග්‍රහාර Online/2022 2022.09.13

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් වෙත,

**<u>රාජ්‍ය නිලධාරීන් සඳහා වූ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය (අග්‍රහාර) - දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලහි ප්‍රධාන විධායක නිලධාරී විසින් යොමු කරන ලද අංක NITF/WEB PORTAL/2021හා 2022.08.30 දිනැති ලිපිය මගින් අග්‍රහාර සාමාජිකයින් සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ 2022.09.30 දිනට පෙර පූර්ණ වශයෙන් දත්ත යාවත්කාලීන කරන මෙන් දන්වා ඇත.

02. මේ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වෙබ් අඩවියට (www.nitf.lk) පිවිස අදාල තොරතුරු යාවත්කාලීන කළයුතු ආකාරය පිළිබඳ උපදෙස් මාලාව ඇතුළත් අත්පොත සහ වීඩියෝව පරිශීලනයෙන් මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගත හැකි අතර ඒ සඳහා පහත දිගු ඔස්සේ ඔබට අවශ්‍ය වැඩිදුර උපදෙස් ලබාගැනීමේ හැකියාව පවතින බව දන්වා සිටිමි. ඒ අනුව ඔබගේ තොරතුරු 2022 සැප්තැම්බර් 21 දිනට පෙර යාවත්කාලීන කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

පිවිසීමේ දිගුව: https://nitf.lk/en/ilogin.php
වීඩියෝ පටය සඳහා දිගුව: https://www.youtube.com/watch?v=MWlJV2JfIa8
පරිශීලක අත්පොත සඳහා දිගුව: https://nitf.lk/f/admin/doc/AWP%20Login.pdf

03. මෙලෙස දත්ත ඇතුලත් කිරිමේදී යම් අපහසුතාවයක් හෝ දත්ත ඇතුලත් කිරිමට නොහැකි වුවහොත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ විෂය භාර නිලධාරිනිය (වී.පී.සේනාරත්න මෙය - 0115921659 / 0112320041) දැනුවත් කල යුතුය.

04. තවද, මින් පෙර ඔබට හට දැනුම් දී ඇති පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ සියලුම නිලධාරින්ගේ තොරතුරු යාවත්කාලීන කිරිම සඳහා දත්ත රැස්කිරීමට දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ගූගල් ෆෝරමය (Google Forms) මේ වනතෙක් සම්පූර්ණ කිරීමට නොහැකි වූ සියලුම නිලධාරින්, පහත දිගුව ඔස්සේ ඇතුළත් වී 2022 සැප්තැම්බර් 20 වන දිනට පෙර එම ෆෝරමය සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එසේම දැනට අග්‍රහාර දත්ත පද්ධතිය තුල තොරතුරු ඇතුලත් නොවන නිලධරින්ගේ දත්ත යාවත්කාලින කරගැනිම සඳහා මෙම ගූගල් ෆෝරමය භාවිත කෙරෙන බැවින් කඩිනමින් දත්ත ඇතුලත් කිරිමට කටයුතු කරන මෙන් තවදුරටත් දන්වමි.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමේ ගූගල් ෆෝරමය
https://docs.google.com/forms/d/1ye9zf4zc9S3g47Up_waIjIhyieXgUxuM3qk6aJgwDHU/edit

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට සම්බන්ධ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හී සේවයේ නියුතු නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමේ ගූගල් ෆෝරමය

https://docs.google.com/forms/d/1xl5sT3QG755YCZ9-VCCWnj9mRQQNs-6V20E9h1vKLyE/edit

05. තවද ඉදිරියේදී අග්‍රහාර රක්ෂණ හිමිකම් සම්බන්ධ සියලු කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකිරීමට අපේක්ෂා කරන බැවින් නිවැරදි දත්ත ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

06. මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ඩී.එම්.ආර්.දිසානායක**
අධ්‍යක්ෂ (පාලන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට